# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2132/2 - 2019 ජූලි මස 15 වැනි සඳුදා - 2019.07.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**දකුණු පළාතේ පළාත් සභාව**

දකුණු පළාත් සභාවේ 2019 අංක 03 දරන කෘෂිකර්ම ප්‍රඥප්තිය

**නියෝග**

දකුණු පළාත් සභාවේ 2019 අංක 03 දරන කෘෂිකර්ම ප්‍රඥප්තියෙහි 17 වගන්තිය යටතේ දකුණු පළාත් සභාවේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජලසම්පාදන හා ජලාපවහන, ආහාර හා සැපයුම් හා බෙදාහැරීම්, වෙළෙඳ අමාත්‍යවරයා වන මා විසින් පහත සඳහන් නියෝග මෙයින් පනවනු ලැබේ. මෙම නියෝග *ගැසට් පත්‍රයේ* පළ කරන දිනයේ සිට බලපැවැත්විය යුතු ය.

**උඩලමත්ත ගමගේ දයාවංශ ආරියතිලක,**
දකුණු පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග,
ජල සම්පාදන හා ජලාපවහන, ආහාර හා සැපයුම් හා බෙදාහැරීම්,
වෙළෙඳ සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය.

2019 අප්‍රේල් මස 09 වැනි දින,
4 මහල, දක්ෂිණපාය, ලබුදූව, ගාල්ල,
දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍ය කාර්යාලයේ දී ය.

*නියෝග*

**දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂි සංවර්ධන ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීම**

*කොන්දේසි* :-

1. නිශ්චිත වූ කෘෂිකාර්මික කටයුත්තක් සඳහා දකුණු පළාත තුළ ස්ථාපනය කරන ලද ස්වේච්ඡා සංවිධානයක් විය යුතු ය. (කාබනික නිෂ්පාදන, අගය එකතු කළ නිෂ්පාදන, යහපත් කෘෂි පිළිවෙත් /GAP යටතේ සිදු කරනු ලබන කෘෂිකර්ම නිෂ්පාදන, කෘෂිකාර්මික බීජ හා රෝපන ද්‍රව්‍ය නිෂ්පාදන, මී මැසි පාලනය, බිම් මල් වගාව, මල් වගාව වැනි දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පිළිගනු ලබන කෘෂිකාර්මික නිෂ්පාදන)
2. ස්වේච්ඡා සංවිධානය නිශ්චිත වශයෙන් පිහිටුවා මාස 06 ක කාලයක් අඛණ්ඩව ක්‍රියාත්මක තත්වයේ පැවතිය යුතු ය.
3. ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකවරයාගේ අධීක්ෂණය යටතේ ස්වේච්ඡා සංවිධානය ක්‍රියාත්මක වීමට එකඟ විය යුතු ය.
4. ස්වේච්ඡා සංවිධාන සම්බන්ධයෙන් දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පනවා ඇති සහ ඉදිරියේදී පනවනු ලබන කොන්දේසි වලට යටත් විය යුතු ය.


1A - PG 4597 — 20 (2019/07)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5. ස්වේච්ඡා සංවිධානය විසින් වාර්ෂික සැලැස්මක් යටතේ සිය ක්‍රියාකාරකම් ඉටු කළ යුතු ය.
6. ස්වේච්ඡා සංවිධානයේ සියළුම වාර්ෂික වැඩසටහන් බල ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකවරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.
7. ස්වේච්ඡා සංවිධානය විසින් නිශ්චිත කාල පරාසයක් තුළදී සාමාජික රැස්වීම් පවත්වා වාර්තා තබා ගැනීමට කටයුතු කළ යුතු ය.
8. ඉහත කාල පරාසය අවම වශයෙන් මාස 02 ක් වත් විය යුතු අතර, අවම වශයෙන් මසකට වරක් හෝ රැස්විය යුතු ය.
9. ලියාපදිංචි වීම සඳහා එවැනි සාකච්ඡා වාර වාර්තා 06 ක් ඉදිරිපත් කළ යුතු ය.
10. ස්වේච්ඡා සංවිධානය සඳහා දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ලබා දෙනු ලබන අතුරු ව්‍යවස්ථාවන් අදාළ කර ගත යුතු ය.
11. ස්වේච්ඡා සංවිධානයක අවම වශයෙන් සාමාජිකයන් 10 දෙනෙකු සිටිය හැකි අතර, උපරිම සාමාජික සංඛ්‍යාව 25 ක් විය යුතු ය.
12. ස්වේච්ඡා සංවිධාන ග්‍රාම නිලධාරී මට්ටමින් හෝ කෘෂිකර්ම උපදේශක බල ප්‍රදේශ මට්ටමින් හෝ ගොවිජන සේවා බල ප්‍රදේශ මට්ටමින් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ මට්ටමින් හෝ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කලාප කාර්යාල මට්ටමින් හෝ ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇත.

*ලියාපදිංචි කිරීම :*

1. විධිමත් ඉල්ලුම් පත්‍රයක් මගින් ඉල්ලුම් කළ යුතු ය.
2. අයදුම්පත්‍ර ගොවිජන සේවා මධ්‍යස්ථාන වල පිහිටි ව්‍යාප්ති කාර්යාල, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල සහ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල මගින් නියමිත ගාස්තු ගෙවා ලබා ගත හැකිය.
3. පළමුවරට ලියාපදිංචි කරනු ලබන ස්වේච්ඡා සංවිධානයක් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් ගෙවීමට යටත් විය යුතු ය.
4. ස්වේච්ඡා සංවිධානයක් ලියාපදිංචි කිරීම හෝ ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමේ බලය දකුණු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ හෝ ඔහු විසින් විධිමත්ව බලය පවරනු ලැබූ දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු විසින් සිදු කළ හැකි ය.
5. එමෙන්ම ලියාපදිංචි කරනු ලැබූ එම සංවිධානයක් නියමිත අරමුණ කරා ළඟා නොවන බව හැඟී යන විටෙකදී එවැනි සංවිධාන අධීක්ෂණ කාලයකට යටත් කිරීම හෝ එම සංවිධාන වල ලියාපදිංචිය අවලංගු කිරීමේ බලය දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු වන්නේ ය.
6. ස්වේච්ඡා සංවිධානයක් වශයෙන් ලියාපදිංචි වීම සඳහා පහත ආදර්ශ ආකෘතිය ප්‍රකාරව සකස් කරන ලද ආකෘති පත්‍රයක් සම්පූර්ණ කර දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති කාර්යාල වෙත භාර දිය යුතු ය.

**දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**කෘෂිකර්ම සංවර්ධන ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීමේ අයදුම් පත්‍රය**

1. සංවිධානයේ නම :
2. ලිපිනය :
3. දුරකථන අංකය :
4. විද්‍යුත් තැපැල් ලිපිනය :
5. නිලධාරී මණ්ඩලය :

| *සංවිධානයේ දරන තනතුර* | *නිලධාරියාගේ නම* | *ජා. හැ. අංකය* | *ලිපිනය* | *දුරකථන අංකය* |
|---|---|---|---|---|
| සභාපති | | | | |
| ලේකම් | | | | |
| භාණ්ඩාගාරික | | | | |
| කාරක සභාව (අවම වශයෙන් සභිකයින් දෙදෙනෙකුවත් සිටිය යුතු ය.)<br>i. සභික<br>ii. සභික | | | | |

6. ගිණුම් පවත්වා ගැනීම :

6.1 බැංකුව : ........................................ ශාඛාව : ........................................... ගිණුම් අංකය : ............................

ස්වේච්ඡා සංවිධානය විසින් කරනු ලබන නිෂ්පාදන පිළිබඳ විස්තර සැකවින් : (ප්‍රධාන කෘෂි නිෂ්පාදනය හා මාසික නිෂ්පාදනය කරනු ලබන ප්‍රමාණය යනාදිය පිළිබඳ තොරතුරු ඇතුළත්ව)

..............................................................................................................................................................

..............................................................................................................................................................

. ..............................................................................................................................................................

ඉහත සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පනවා ඇති සහ ඉදිරියේදී පනවනු ලබන කොන්දේසි වලට යටත්ව සංවිධානයේ ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමට එකඟ වන බවත් මෙයින් සහතික කරන අතර, මෙම සංවිධානය දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර දෙන ලෙස කාරුණිකව ඉල්ලමු.

| | |
|---|---|
| .................................... | .................................... |
| අත්සන | අත්සන |
| ලේකම් | සභාපති |
| නිල මුද්‍රාව : | නිල මුද්‍රාව : |
| දිනය :- | දිනය :- |

*II වන කොටස - කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා*

**කෘෂිකර්ම උපදේශකවරයාගේ නිර්දේශය :**

.............................................. සංවිධානය මෙම බල ප්‍රදේශය තුළ පිහිටා ඇති බවත්, පසුගිය මාස 06 ක කාලය තුළ සක්‍රීයව පැවති බවත්, ඉදිරිපත් කර ඇති සමිති වාර්තා පරීක්ෂා කර බැලූ බවත්, සහතික කරමි.

ලියාපදිංචි කිරීම නිර්දේශ කරමි/නොකරමි

..................................................................

කෘෂිකර්ම උපදේශකවරයාගේ අත්සන

නිල මුද්‍රාව : දිනය :

**ස්ථාන භාර කෘෂිකර්ම උපදේශකවරයාගේ නිර්දේශය :**

ඉහත සහතිකය නිවැරදි බව සහතික කරමි.

ලියාපදිංචි කිරීම නිර්දේශ කරමි/නොකරමි

..................................................................

ස්ථාන භාර කෘෂිකර්ම උපදේශකවරයාගේ අත්සන

නිල මුද්‍රාව : දිනය :

**විෂයභාර නිලධාරීවරයාගේ නිර්දේශය :**

මෙම සංවිධානයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව සෑහීමට පත් විය හැකිය.

ලියාපදිංචි කිරීම නිර්දේශ කරමි/නොකරමි

..................................................................

විෂයභාර නිලධාරීවරයාගේ අත්සන

නිල මුද්‍රාව : දිනය :

**සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය :**

ලියාපදිංචි කිරීම නිර්දේශ කරමි/නොකරමි

..................................................................

සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අත්සන

නිල මුද්‍රාව : දිනය :

**නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ නියෝගය :**

ලියාපදිංචි කිරීම අනුමත කරමි/නොකරමි

..................................................................

නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අත්සන

නිල මුද්‍රාව : දිනය :

විෂය නිලධාරී

................................. දරන අංකය යටතේ .................................. දින ස්වේච්ඡා සංවිධානයක් ලෙස දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.

.....................................................

විෂය නිලධාරීගේ අත්සන

දිනය :

**දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාබනික පොහොර නිෂ්පාදනය කරන්නන් ලියාපදිංචි කිරීම**

*කොන්දේසි :-*

1. දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
2. කාබනික පොහොර නිෂ්පාදනය කරන මධ්‍යස්ථානය දකුණු පළාත තුළ පිහිටා තිබිය යුතු ය.
3. කාබනික පොහොර නිෂ්පාදන ක්‍රියාවලිය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරනු ලබන දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු හට සාධාරණ කාලයක් තුළදී අධීක්ෂණයට ලක් කිරීමට යටත් විය යුතු ය.
4. නිෂ්පාදනය කරනු ලබන පොහොර වල ගුණාත්මක බව තහවුරු කර ගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ එවැනි බලයලත් නිලධාරියෙකු ඉල්ලා සිටිනු ලබන ඕනෑම අවස්ථාවකදී එම නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර වලින් අවශ්‍ය ප්‍රමාණයේ සාම්පල් නිෂ්පාදකයා විසින් සැපයිය යුතු ය.
5. නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර වල පවත්වා ගත යුතු ලබා දී ඇති ප්‍රමිතීන් නිෂ්පාදකයා විසින් අඛණ්ඩව පවත්වා ගැනීමට කටයුතු කළ යුතු ය.
6. දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ කාබනික පොහොර නිෂ්පාදකයින් වර්ගීකරණයක් කරනු ලැබ ඇති විටෙක එම වර්ගීකරණයෙන් සුදුසු කාණ්ඩයකට කාබනික පොහොර නිෂ්පාදනය ඇතුළත් කිරීමට යටත් විය යුතු ය.
7. නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර අලෙවි කරනු ලබන්නේ නම් දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අනුමත කරනු ලැබූ විධිමත් අසුරණයන් හි බහාලිය යුතු ය.
8. දකුණු පළාත තුළ ඉහත පරිදි කාබනික පොහොර නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදකයෙකුට රුහුණු රසාර අලෙවිසැලහි විධිමත්ව ලියාපදිංචි වී අදාළ කොන්දේසි වලට යටත්ව කාබනික පොහොර සැපයීමට හැකියාව ඇත.

*ලියාපදිංචි වීම :-*

1. දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන අයදුම්පතක් විධිමත්ව සම්පූර්ණ කොට එම බල ප්‍රදේශයේ කෘෂි ව්‍යාප්ති මධ්‍යස්ථානයට එම අයදුම්පත භාර දීම මගින් ලියාපදිංචි වීමට හෝ ලියාපදිංචිය අලුත් කිරීමට හැකියාවක් ඇත.
2. ලියාපදිංචි වීමේදී නියම කරනු ලබන ගාස්තු ගෙවීමට නිෂ්පාදකයා එකඟ විය යුතු ය.
3. දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කාබනික පොහොර නිෂ්පාදකයින් ලියාපදිංචි කිරීමේ සම්පූර්ණ ක්‍රියාවලියට නිෂ්පාදකයා එකඟ විය යුතු ය.
4. ලියාපදිංචි කිරීමේ දී නිෂ්පාදකයා වෙත දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි අංකයක් ලබා දෙනු ලබන අතර ලිපි ගණුදෙනු වලදී එම ලියාපදිංචි අංකය පැහැදිලිව සටහන් කළ යුතු ය.
5. ලියාපදිංචි කිරීම එක් වර්ෂයකට පමණක් වලංගු වන අතර එම වර්ෂය අවසානයේ දී නව වර්ෂය සඳහා නියමිත ගාස්තුව ගෙවා ලියාපදිංචිය අලුත් කළ යුතු ය.
6. වර්ෂයක කාලයක් ලෙස අදාළ වර්ෂයේ ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වේ. එක් එක් වර්ෂය හිදී කාබනික පොහොර නිෂ්පාදකයින් ලියාපදිංචි කිරීම හෝ ලියාපදිංචිය අලුත් කිරීම ඒ ඒ වර්ෂයේ ජනවාරි 01 දින සිට මාර්තු 31 දින දක්වා අතර කාලයේ දී සිදු කළ යුතු ය.
7. අලුතින් ලියාපදිංචි වන නිෂ්පාදකයෙකු අවම වශයෙන් එම නිෂ්පාදන ක්‍රියාවලියේ මාස 06ක කාලයක් නියැලී සිටිය යුතු අතර, අවශ්‍ය අවස්ථාවක දී එය තහවුරු කිරීමට හැකියාව තිබිය යුතු ය.

## දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

## කාබනික පොහොර නිෂ්පාදනය කරන්නන් ලියාපදිංචි කිරීමේ අයදුම් පත්‍රය

**පෞද්ගලික තොරතුරු :-**

01. නම :-
02. වයස :-
03. ලිපිනය :-
04. විද්‍යුත් තැපැල් ලිපිනය :-
05. ස්ත්‍රී/පුරුෂ :-
06. බැංකුව :- බැංකු ශාඛාව :- ගිණුම් අංකය :-
07. දුරකථන අංකය :- නිවස :- ජංගම :-

**පිහිටීම :-**

08. දිස්ත්‍රික්කය :-
09. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :-
10. ගොවිජන සේවා බල ප්‍රදේශය :-
11. කෘෂි උපදේශක කොට්ඨාසය :-
12. ග්‍රාම නිලධාරී වසම හා අංකය :-

**නිෂ්පාදන තොරතුරු :-**

13. නිෂ්පාදනය ආරම්භ කළ දිනය :-
14. මේ දක්වා නිෂ්පාදනය කර ඇති කාබනික පොහොර ප්‍රමාණය :-
15. කාබනික පොහොර නිෂ්පාදනය වැඩි දියුණු කර ගැනීම සඳහා ඔබ අපේක්ෂා කරන්නේ ද? එසේ නම් ඒ සඳහා ඔබ සතුව ඇති යටිතල පහසුකම් සඳහන් කරන්න. (භූමි ප්‍රමාණය, කාබනික පොහොර ගබඩා කිරීම/ඇසුරුම් කිරීම සඳහා පහසුකම්)
16. කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ඔබ භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය හා එම අමුද්‍රව්‍ය සපයා ගනු ලබන ආකාරය :-

| *භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය* | *එම අමුද්‍රව්‍ය සපයා ගනු ලබන ආකාරය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

17. ඉහත සපයනු ලබන තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පවතින කොන්දේසි වලට යටත්ව මෙම දෙපාර්තමේන්තුවේ කාබනික පොහොර නිෂ්පාදකයෙකු ලෙස ලියාපදිංචි වීමට එකඟ වන බවත් සහතික කරමි.

...................................... ......................................
දිනය අයදුම්කරුගේ අත්සන

*II වන කොටස - කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා*

**කෘෂිකර්ම උපදේශකවරයාගේ නිර්දේශය :**

නිෂ්පාදකයා විසින් නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර ප්‍රමිතියට අනුකූල වේ.

ලියාපදිංචි කිරීම නිර්දේශ කරමි/නොකරමි
.....................................................................

කෘෂිකර්ම උපදේශකවරයාගේ අත්සන

නිල මුද්‍රාව : දිනය :

**ස්ථාන භාර කෘෂිකර්ම උපදේශකවරයාගේ නිර්දේශය :**
කාබනික පොහොර ප්‍රමිතියට අනුකූල වේ.

ලියාපදිංචි කිරීම නිර්දේශ කරමි/නොකරමි
....................................................................

ස්ථානභාර කෘෂිකර්ම උපදේශකවරයාගේ අත්සන

නිල මුද්‍රාව : දිනය :

**විෂයභාර නිලධාරීවරයාගේ නිර්දේශය :**

ලියාපදිංචි කිරීම නිර්දේශ කරමි/නොකරමි

.....................................................................

විෂයභාර නිලධාරීවරයාගේ අත්සන

නිල මුද්‍රාව : දිනය :

**සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය :**

ලියාපදිංචි කිරීම නිර්දේශ කරමි/නොකරමි

.....................................................................

සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අත්සන

නිල මුද්‍රාව : දිනය :

**නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ නියෝගය :**

ලියාපදිංචි කිරීම අනුමත කරමි/නොකරමි.
.......................................................................

නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අත්සන :

නිල මුද්‍රාව : දිනය :

**විෂය නිලධාරී**

................................ දරන අංකය යටතේ .................................. දින කාබනික පොහොර නිෂ්පාදකයෙකු ලෙස දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.

....................................................
විෂය නිලධාරීගේ අත්සන

දිනය :

08 - 03

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.